# වියළි කලාපයේ රබර් වගාකල හැකිද?


## එන්. යෝගරත්නම් සහ අනුර දිසානායක


ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තය සැලකීමේදී රබර් වගාව කෙරේ වැදගත් ස්ථානයක් හිමි වී ඇත. ජාතික ආදායමට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙමින් අක්කර 500,000 ක භූමි ප්‍රමාණයක ව්‍යාප්ත වී ඇති රබර් වගාව බොහෝ දුරට තෙත් කලාපයට පමණක් සීමා වී ඇත. ඊට ප්‍රධාන හේතුවක් වශයෙන වර්ෂාව ද සැලකිය හැක. රබර් ශාඛයේ මනා වර්ධනය සඳහා ජලය අත්‍යාවශ්‍ය සාධකයකි. සාමාන්‍යයෙන් රබර් ශාකයට අවශ්‍ය මෙම ජල ප්‍රමාණය ලබාදෙන වර්ෂාපතන රටාවක් ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට ආවේනික වී තිබීමෙන් රබර් වගාව එහි ව්‍යාප්ත වී ඇතැයි කිවහැක. මෙවැනි හිතකර කාලගුණික හා යෝග්‍ය පාංශු තත්ත්වයන් යටතේ තෙත් කලාපය තුල සාර්ථකව රබර් වගාව සංස්ථාපනය කර ඇති හෙයින් අළුතින් වගා කිරීම සඳහා ලබාගත හැකි ඉඩම් ප්‍රමාණය සීමාවී ඇත. එහෙත් මීට පිළියම් වශයෙන් ඉඩම් ලබාගත හැකි වෙනත් ප්‍රදේශවල රබර් වගා කිරීම කෙරේ සැලකිල්ල දැක්වීමට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය උත්සුක වීමේ ප්‍රතිඵලයක් ලෙස අලුත් අත්දැකීම් රාශියක් මෙසේ ඔබ හමුවේ තැබීමට අවකාශ ලැබී ඇත.

තෙත් කලාපයෙන් බැහැරව අන්තර් මාධ්‍ය කලාපය හා වියළි කලාපය තුල රබර් වගා කිරීමේ හැකියාව අධ්‍යයනය කිරීම සඳහා මූලික පියවරක් ලෙස මහවැලි ''සී'' කලාපයේ පර්යේෂණාත්මක මට්ටමින් ව්‍යාපෘතියක් ආරම්භ වීම, වගා ඉඩම් ප්‍රමාණය වැඩිකරලීමේ අරමුණෙහි ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැක. එහෙත් රබර් ශාඛයේ වර්ධනයට අත්‍යාවශ්‍ය වූ ජල ප්‍රමාණය ලබා දීමට තරම් ප්‍රමාණවත් වර්ෂාපතනයක් මෙම ප්‍රදේශයට නොලැබෙන හෙයින් වාරි ජලය ඒ සඳහා උපයෝගී කර ගැනීමට තීරණය විය. එවැනි පසුබිමක් යටතේ මහවැලි ''සී'' කලාපයේ ගිරාඳුරුකෝට්ටෙ ප්‍රදේශයේ ආරම්භ කළ මෙම පර්යේෂණ ව්‍යාපෘතිය පිළිබඳව විස්තර ඉදිරිපත් කිරීම මෙම ලිපියේ ප්‍රධාන අරමුණ වේ.

ගිරාඳුරුකෝට්ටේ ප්‍රදේශය මහවැලි ''සී'' කලාපයේ කේන්ද්‍රස්ථානය ලෙස සැලකේ. මහවැලි ජලය රැස්කර තබා ගනිමින් උල්හිටිය හා රත්කිඳ ජලාශ මෙම ප්‍රදේශයේ වගා කටයුතු කෙරෙහි අවශ්‍ය වාරි ජලය ලබාදෙයි. ඇල මාර්ග ඔස්සේ ගලායන මෙම ජලය රබර් ව්‍යාපෘතියට ලබා ගැනේ. වර්ෂ 10 ක් පමණ වූ කාල පරිච්ඡේදයක් තුල වාර්තා ගතවී ඇති දත්ත වලට අනුව මෙම ප්‍රදේශයට ලැබෙන වාර්ෂික වර්ෂාපතනය සාමාන්‍යයෙන් 60'' ක් පමණ වේ.

රබර් වගා කිරීමේ මූලික අධ්‍යයනය සඳහා ලබාදුන් අක්කර 10 ක භූමි ප්‍රමාණයේ විසිරී පවතින පස උල්හිටිය පාංශු ශ්‍රේණියට අයත් වේ. ජලවහනය අතින් ඉතා හොඳ තත්ත්වයක පවතින ප්‍රදේශ මෙන්ම ජලවහනය මධ්‍යස්ථ වූ ප්‍රදේශ ද මෙම භූමියේ දැකිය හැක. වැලිමය ලෝම ස්වභාවයකින් යුක්තවූ වයනයක් ඇති මෙම පස් පෝෂක වලින්

සරුබවක් දක්වන අතර තරමක් ආම්ලික තත්ත්වයක පවතී. 2% - 3% ක් පමණ වූ සුළු බෑවුමකින් යුතු මෙම භූමියේ ඇතැම් කොටස් තැනිතලා ස්වභාවයකින් යුක්තවන අතර සමස්ථයක් ලෙස භූමිය තරංගාකාර සවභාවයක් ගනී.

රබර් වගාවට හඳුන්වා දී ඇති ක්ලෝන 4 ක් වාරි ජලය යටතේ වගා කිරීම පරීක්ෂණයේ මූලික අරමුණ වේ. මෙහිදී ආර්.ආර්.අයි.සී. 100, 102, 103 හා 121 ක්ලෝන වාරි ජලය යටතේ මෙන්ම ස්වාභාවික වර්ෂාපතන තත්ත්ව යටතේද වගා කිරීම පරීක්ෂා කෙරේ. මෙම ක්ලෝන 4 සඳහාම, හරිත බද්ධයෙන් ලබාගත් පැල පොලිතින් මලුවල සිටුවීමෙන් පසු හා දුඹුරු බද්ධයෙන් ලබා ගත් පැල එක එල්ලේම ක්ෂේත්‍රයේ සංස්ථාපනය කිරීමෙන් ශාඛ 45 කින් යුත් පර්යේෂණ පාත්ති සකසා ඇත. සාමාන්‍ය රබර් වගාවකදී අනුගමනය කරනු ලබන 12′ × 20′ පරතරයකින් යුතුව සිටුවා ඇති මෙම රබර් පැල සමග පියුරේරියා හා ඩෙස්මෝඩියම් ආවරණ බෝග ලෙස වගාකර ඇත. වගාකිරීම සඳහා අවශ්‍ය වූ රබර් පැල ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නිවිතිගල කැලේ හා පයාගල වතුයායට අයත් ලාගෝස් වත්තේ ග්‍රාහක තවාන් පිහිටවූ අතර, හරිත බද්ධ කර පොලිතින් මලුවල සිටවූ පැල මාතලේ, නාලන්ද රාජ්‍යය වතුයායට ප්‍රවාහනය කරන ලදී. මෙම පැල ක්‍රමයෙන් වියලි කාලගුණික හා පාරිසරික තත්ත්ව වලට අනුවර්තනය කරවීම මෙහි ප්‍රධාන අරමුණ විය. ඉන්පසුව මෙම පැල 1986 ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලදී ගිරාඳුරු කෝට්ටෙට ප්‍රවාහනය කරන ලදී. ප්‍රවාහනයේදී කිසිදු පැලයකට කුමන අන්දමක හෝ හානියක් සිදු නොවීම මෙහිදී විශේෂයෙන් සඳහන් කල යුතුය.

1986 නොවැම්බර් මස අවසාන සතිය තුල හා දෙසැම්බර් මස මුල් සතිය තුල ක්ෂේත්‍රයේ මෙම පැල සිටුවන ලදී. මෙම කාලය තුලදී එනම්, ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවල දී පිළිවෙලින් මිලි මීටර් 350, 200 ක හා 450 ක වර්ෂාපතනයක් ලැබීම සැලකිය යුතු වර්ෂාපතනයක් වර්ෂයේ එක් කාලයකදී මෙම ප්‍රදේශයට ලැබෙන බවට සාක්ෂි සැපයීමක් බඳුවිය. රබර් ශාඛයේ වර්ධනයට ප්‍රමාණවත්වන වර්ෂාපතන ප්‍රමාණයක් 1987 මාර්තු, අප්‍රේල් අතර කාලය තෙක් ලද හෙයින් වාරි ජලය සැපයීමේ අවශ්‍යතාවයක් නොවීය. එහෙත් අප්‍රේල් මස මැද භාගයේ සිට ඇතිවූ නියඟයට ඔරොත්තු දිය හැකි පරිදි පැලවලට වාරි ජලය සපයන ලදී.

වාරි ජලය සඳහා නවීන හා සංකීර්ණ ක්‍රම අනුගමනය කල හැකි වුව ද, ආර්ථිකමයව ලාභදායී වන ලෙස සාමාන්‍ය ඇල මාර්ග ඔස්සේ ජලය ලැබෙන පරිදි වාරි පද්ධතිය සකසා ඇත. අඟල් 9 ක් පමණ ගැඹුරු වූ කුඩා කානු රබර් ගසේ සිට අඩි 2 ක් ඈතින් පිහිටන සේ ශාඛයට දෙපසින් ඉදිකර ඇත. රබර් පේලි අතර ඉදිවී ඇති මෙවැනි කානු පද්ධතියක් තුලින් රබර් ශාඛයට අවශ්‍ය ජල ප්‍රමාණය ලබාදේ. සතියකට එක් වතාවක් පමණක් මෙසේ ජලය ලබාදෙන අතර එය රබර් ගසේ වර්ධනයට ප්‍රමාණවත් වී ඇත.

මීට අමතරව අක්කර 2 ක් වූ භූමි ප්‍රමාණයක රබර් වගාව සමඟ තේ අතුරු බෝගයක් ලෙස වගා කිරීමට ඇති හැකියාව ද අත්හදා බැලීම කරනු ලැබේ. ඉහතදී දැක්වූ සියළුම ක්ලෝන වල රබර් පැල සමඟ අතුරු බෝගයක් ලෙස තේ වගා කිරීමේදී රබර් සඳහා නිර්දේශිත 8′ × 30′ දුර ප්‍රමාණ භාවිතා කර ඇත. රබර් පේලි 2 ක් අතර තේ ශාක පේලි 6 ක් මෙසේ අතුරු වගා කර ඇත. මේ සඳහා ද වාරි ජලය ලබා දේ.

සිටුවා මාස 3 කට පසු කරන ලද සංගණනයකට අනුව පොලිතින් මලුවල සිටුවා ක්ෂේත්‍රයේ සිටවූ පැලවලින් 97% ක් හා එක එල්ලේම ක්ෂේත්‍රයේ සිටවූ පැල (bare root) වලින් 80% ක් ද ඉතා හොඳ

තත්ත්වයක පැවැතීමෙන් වියළි කලාපය තුළ රබර් වගාවට ඇති විභවය පිළිබඳව වටහාගත හැක.

මාස 6 කට පසුව ශාකවල වර්ධනය ඇගයීම සඳහා කරන ලද වර්ධන මිණුම් වලට අනුව ශාකයන්ගේ උස හා කඳේ වට ප්‍රමාණය සතුටුදායක තත්ත්වයක පැවතීම මෙන්ම තෙත් කලාපයේ සාමාන්‍ය රබර් වගාවන්හි බහුල දිලීර රෝග මෙම පර්යේෂණාත්මක වගාවේදී දෘශ්‍යමාන නොවීමද මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය. වියළි කලාපයට ආවේනික වූ මානා, ඉලුක් හා කිරිදි ක්ෂේත්‍රයේ බහුලව දැකිය හැකි වල් පැලෑටි වන අතර රබර් වගාව කෙරේ ඉන් ඇතිවී ඇති තර්ජනය සුළුකොට තැකිය නොහැක.

මෙවැනි පසුබිමක් යටතේ මෙතෙක් ප්‍රගතියක් දක්වා ඇති "ගිරාඳුරුකෝට්ටේ රබර් වගාව" තවදුරටත් ඇගැයීම සඳහා පාංශු හා පත්‍ර විශ්ලේෂණය, වර්ධන මිනුම් යොදා ගැනීමට බලාපොරොත්තුවන අතර පාංශු ජල තත්ත්වයන් ශාකවල වර්ධනයට බලපාන අයුරු පිළිබඳව හා ශාකයන්ගේ ජල තත්ත්වය පිරික්සීම සඳහා ද සැලසුම් සකස් කොට ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංවර්ධන ව්‍යාපාරය වන 'මහවැලිය' මගින් පෝෂණය වන ගිරාඳුරුකෝට්ටේ ප්‍රදේශයේ, පර්යේෂණාත්මක මට්ටමින් ආරම්භ කරන ලද රබර් වගාව හා මෙතෙක් එය ලබා ඇති ප්‍රගතිය පිළිබඳව දක්වා ඇති තොරතුරු වලට අනුව වියළි කලාපය තුල රබර් වගා කිරීමට ඇති හැකියාව පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි බව අපගේ විශ්වාසයයි.

(කවරයේ ඡායාරූපයෙන් වියළි කලාපයේ රබර් වගාව පෙන්නුම් කරයි)